
# අසරණ කුරුළු පැටියා



මිනුති විහාරා පතිරාජ

# අසරණ කුරුළු පැටියා


## මිනුති විහාරා පතිරාජ

පළමුවන දිග හැරුම

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

6 ශ්‍රේණිය B



2026-05-10

ISBN : 978-624-211-360-9

# පිදුම

මාගේ සෙවනැල්ලක් මෙන්

මා අසලම සිට

රටට වැඩදායි

පුරවැසියෙකු කිරීමට

වෙහෙස මහන්සිවන

ආදරණීය දෙමාපියන්ටත්

මාගේ විදුහල්පතිතුමිය සහ

පංති භාර ගුරුතුමියටත්

මාගේ අක්කිටත්

අක්කිගේ ආදරණීය ගුරු පියාණන් වූ

මෙම ග්‍රන්ථය රචනා කිරීමට

මා පෙළඹූ වූ

ආදරණීය සෙනවිරත්න ගුරු පියාණන්ටත්

මෙය උපහාරයක් වේවා.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතුකළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟ පෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලියි

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය,<br>
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි බට්ටි කියලා අක්කා කෙනෙකුයි චුට්ටි කියලා නංගි කෙනෙකුයි ජීවත් වුණා. මෙයාලා හරි සතුටින් තමයි ජීවත් වුණේ.



මේ පවුල පිං දහම්  කරන්න හරිම කැමතියි. අන් අයට උදවු කරන්නත් හරිම කැමතියි.

මෙයාලගේ ගෙදර ළඟම තමයි ගමේ පන්සල තිබුණේ. මෙයාලා නිතරම බුදුන් වඳින්න බෝධි පුජා තියන්න පන්සලට යනවා.





එදත් මේ අම්මයි තාත්තායි බට්ටියි චුට්ටියි පන්සල් යන්න ලෑස්ති වුණා. අම්මා තෙල්, හඳුන්කූරු, පහන්තිර ලෑස්ති කර ගත්තා.

බට්ටියි චුට්ටියි මල් කඩන්න ගියා. මේ දෙදෙනා මල් කඩාගෙන පැමිණි පසු සියලු දෙනා පන්සල් ගියා.



පන්සල් ගොස් මෙයාලා පිළිම වහන්සේ, චෛත්‍ය වහන්සේ, බෝධීන් වහන්සේ පිරිසිදු කළා. මල් තබන ස්ථානයත් පිරිසිදු කළා, මිදුල ඇමඳුවා. එතකොට බට්ටි දැක්කා බෝධීන් වහන්සේ අවට කුරුලු රෑනක් පියාසර කරනවා.



පවුලේ සියලු දෙනා එකතු වී විහාරස්ථානය පිරිසිදු කර පුජාව පිළියෙල කළා. පුජාව පිළියෙල කරන අතරතුර පන්සලේ සිටින ටොමී කියන බල්ලා ඔවුන් ළඟට ආවා.

තාත්තා පහන් පත්තු කළා. බට්ටි හඳුන්කූරු පත්තූ කළා. අම්මා ගිලන්පස පූජා කළා. චූට්ටි මල් පූජා කළා. ඒ අතරතුර කුරුලු රෑනක් එහෙ මෙහෙ පියෑඹුවා.





පූජාව අවසානයේ බුදුන් වැඳීම සඳහා බෝධීන් වහන්සේ ඉදිරිපිට වාඩි වුණා. ටොමිත් ළඟ වාඩි වුණා.



කුරුල්ලන් ඉගිලෙනවා. බිමට එනවා. බෝ ගසේ අතු අතරින් ඉගිලෙනවා. කෑ ගහනවා. ටොමී එයාලව අල්ලන්න උඩ පනිනවා.



චූටිටි බුදුන් වඳින්නේ නෑ අර කුරුල්ලන් සෙල්ලම් කරන දිහා බලන් ඉන්නවා. එක්වරම කුරුල්ලන් භයියෙන් කෑගහන්න පටන් ගත්තා.



චුට්ටි එක් වරම අනේ අම්මේ කියලා කෑ ගැහුවා. එතකොටම ටොමී වේගයෙන් දිව්වා. අම්මා ඉක්මනට නැගිටලා ටොමී දිව්ව පැත්තට ගියා. අනේ පව් චූටි කුරුළු පැටියෙක් බිමට වැටිලා. ටොමී එයාව අල්ලන්න යනවා. අම්මා ටොමීව එතනින් එලෙව්වා.


කුරුලු පැටියට ඉගිලෙන්න බෑ. කුරුලු පැටියා හොඳටම බයවෙලා. එයා බයේ ගැහෙනවා. තාත්තයි බට්ටියි  අපි ළඟට ආවා. බිම හිටිය කුරුලු පැටියට චුට්ටි වතුර ටිකක් පෙව්වා. කුරුලු පැටියා වතුර චුට්ට චුට්ට බිව්වා. අනේ පව් එයාට හොඳටම වතුර තිබහ හැදිලා එයාගේ වතුර තිබහ අඩු වෙනකම් වතුර පෙව්වා.





අප අවට සිටි අනෙක් කුරුල්ලන් හයියෙන් කෑ ගහනවා. එයාලාගේ යාලුවට කරදරයක් වෙලා කියලා ඒ කුරුල්ලන් අනෙක් අයට කියනවා. එයාලා කෑගහලා කියන්නේ එයාලගේ යාලුවා බේරා දෙන්න කියලා. බලන්න සතුන්ගේ වුනත් තියෙන එකමුතුකම.

වතුර බී අවසන් වූ පසු කුරුලු පැටියා වට පිට බැලුවා. හෙමින් හෙමින් පැන පැන ඉස්සරහට ගියා. පසුව කුරුලු පැටියා ඉගිලි එයාගේ යහලුවන් ළඟට ගියා. අපට හරිම සතුටුයි. කරදරයට පත් වූ සතෙකුට පිහිට වෙන්න පුළුවන් වීම ගැන.



කරදරයකට පත් වූ සතුන්ට පිහිට වෙන එක මිනිසුන් සතු උතුම් ගුණාංගයකි. ඉතින් යහලුවනේ ඔයාලත් අපි වගේ කරදරයට පත්වු සත්තුන්ට පිහිට වෙන්න. එයයි මේ කතාන්දරයෙන් දෙන්න පුළුවන් ආදර්ශය.

# අසරණ කුරුළු පැටියා



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශයේ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ග්‍රන්ථකරණයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට ශ්‍රේෂපත්‍රයක් උපකාරී වූ වැඩසටහනක් බව අභිමානයෙන් යුතුව පිළිගනිමු. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමග පරිශීලනය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ  පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය කියවීම මෙන්ම සාක්ෂරතා නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සබැඳිව ගැන්වීමේ ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දළදාබිම තිලක තුමින් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාරක මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN : 978-624-211-360-9